# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,955 - 2016 පෙබරවාරි මස 19 වැනි සිකුරාදා - 2016.02.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 622 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 624 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 625 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 මාර්තු මස 04 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 පෙබරවාරි මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු – ඇබෑර්තු

## මහව ප්‍රාදේශීය සභාව

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන කාර්ය මණ්ඩලයේ පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති, ඒ ඒ තනතුරට ඉදිරියෙන් දක්වා ඇති සුදුසුකම් සහිත අයගෙන් 2016.03.21 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *සේවක ගණය* | *තනතුරු ප්‍රමාණය* | *වැටුප් පරිමාණය* |
|---|---|---|---|
| 01. බර වාහන ක්‍රියාකරු | ප්‍රාථමික ශිල්පීය | 01 | 06/2006 - (iv) අනුව - රු. 12, 470 - 10 x 130 - 10 x 145 -10 x 160 - 12 x 170 - රු.18,860 |
| 02. විදුලි කාර්මික | ප්‍රාථමික ශිල්පීය | 01 | 06/ 2006 - (iv) අනුව - රු. 12, 470 - 10 x 130 - 10 x 145 -10 x 160 - 12 x 170 - රු. 18,860 |
| 03. මාර්ග කම්කරු | ප්‍රාථමික ශිල්පීය නොවන | 01 | 06/2006 - (iv) අනුව රු. 11, 730 - 10 x 120 - 10 x 130 -10 x 145 - 12 x 160 - රු. 17,600 |
| 04. සෞඛ්‍ය කම්කරු | ප්‍රාථමික ශිල්පීය නොවන | 01 | 06/2006 - (iv) අනුව රු. 11, 730 - 10 x 120 - 10 x 130 -10 x 145 - 12 x 160 - රු. 17,600 |

02. *මූලික අධ්‍යාපන සුදුසුකම් .—* ***ප්‍රාථමික ශිල්පීය ගණය :***

*බාහිර අයදුම්කරුවන් .—* අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත් වී තිබිය යුතු ය. (අවම වශයෙන් එක් වතාවක දී විෂයයන් 05ක් සමත්විය යුතු ය.)

*අභ්‍යන්තර අයදුම්කරුවන් .—* දැනට මහව ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතු ය.

*II. ශිල්පීය නිපුණතා .—*

(a) බරවාහන ක්‍රියාකරු තනතුර සඳහා තනතුරේ වාහන රියැදුරු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතු ය. (සේවා සහතික මගින් සනාථ කළ යුතු ය.)

(b) බරවාහන ක්‍රියාකරු තනතුරු සඳහා තනතුරේ කාර්ය භාරයට අදාළව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකය ලබා තිබිය යුතු ය. (A පන්තියේ රියැදුරු බලපත්‍රයක්).

*III. ප්‍රවීණතා -* පළපුරුද්ද .— ITAT සහතිකය හෝ NVQ 4 සහතිකය සමග බරවාහන රියැදුරු වශයෙන් වසර 05ක පළපුරුද්ද තිබිය යුතු ය.

*ශිල්පීය නිපුණතා .—* විදුලි කාර්මික තනතුර සඳහා තනතුරේ කාර්ය භාරයට අදාළව තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද NVQ 4 මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

*ප්‍රවීණතා පළපුරුද්ද .—* පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 03ක පළපුරුද්දක් තිබීම, (සේවා සහතිකයක් මගින් සනාථ කළ යුතු ය).

***ප්‍රාථමික ශිල්පීය නොවන :***

*මූලික අධ්‍යාපන සුදුසුකම් .*

*(අ)* අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත් වී තිබිය යුතු ය. (වෛකල්පිත විෂයයන් හැර) ;

*(ආ)* මෙම බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දින එම ප්‍රාථමික ශිල්පීය නොවන තනතුර සඳහා අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වශයෙන් එවකට පැවති බඳවා ගැනීමේ පටිපාටියෙන් අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ.

*03. වයස :* සියළුම තනතුරු සඳහා අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. දැනට පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයට මෙම උපරිම වයස් සීමාව බලනොපායි.

*දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ......................................මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ............................වශයෙන් සේවය කරයි. මෙම තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිය/නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

————————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :————————
පදවි නාමය :————————
දෙපාර්තමේන්තුව/ආයතනය :————————
(නිල මුද්‍රාව තබන්න)

04. *වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතු ය ;
(ii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවු. 45ට නොවැඩි විය යුතු ය;
(iii) අයදුම්කරුවන්/අයදුම්කාරියන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකිකයන් විය යුතු ය;
(iv) විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය;
(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවකු නොවිය යුතු ය;
(vi) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට මහව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය සනාථ කළ යුතු ය. (පදිංචි වසමේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අත්සන් කර නිකුත් කරන ලද ලියවිල්ලකින් සනාථ කළ යුතු ය.);
(vii) දැනටමත් රාජ්‍ය/පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු අයෙකු නම් වයස් සීමාව බල නොපවතින අතර, එකී පූර්වාසන්න වසර 05 තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු ය;
(viii) අයදුම්පත් කැඳවීමෙන් හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීමට හෝ මෙම නිවේදනය අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමේ බලය මහව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

05. *අයදුම්පත් එවිය යුතු පිළිවෙළ.—* සියලුම අයදුම්කරුවන් මෙහි පහතින් ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරගත් අයදුම්පතක් 2016.03.21 දිනට පෙර ලැබෙන සේ "ලේකම්, ප්‍රාදේශීය සභාව, මහව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "............................. තනතුර සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කළ යුතු ය.

අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල අනුපිටපත් ඇමිණිය යුතු ය :-

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතික;
3. හැඳුනුම්පතේ පිටපතක්;
4. ග්‍රාම නිලධාරී සහතිකය;
5. දැනට මෙම ආයතනයේ සේවයේ නියුක්ත වූවන් නම් සේවා සහතිකය.

එච්. එම්. එම්. බී. හේරත්,
ලේකම්,
මහව ප්‍රාදේශීය සභාව.

2016 පෙබරවාරි මස 05 වැනි දින,
මහව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*මහව ප්‍රාදේශීය සභාව*

*.................... තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. (i) මුලකුරු සමග නම :————————
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් :————————
02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————————
03. ජාතික හැඳුනුම්පත් අංකය :————————
04. ස්ත්‍රී/පුරුෂභාවය :————————
05. උපන් දිනය:
අවුරුද්ද:——— මාසය:———— දිනය :————,

06. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස :
අවුරුදු :———, මාස:——, දින :———,
07. විවාහක/අවිවාහක බව :——————
08. ජාතිය :——————
09. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද? යන වග :——————
10. අධ්‍යාපන සුදුසුකම්:——————
11. වෙනත් සුදුසුකම්:——————

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බව ඔප්පු වුවහොත් හෝ පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

02-602

# පළාත් පාලන නිවේදන

### වාරියපොළ ප්‍රාදේශීය සභාව

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා පනත)

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තිය සමග කියවිය යුතු, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව වාරියපොල ප්‍රාදේශීය සභාවේ ලේකම් යාපා මුදියන්සේලාගේ සේනානායක වන මම,

ප්‍රාදේශීය සභා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ක්‍රියාත්මක විය යුතු බව 2016.01.21 දිනැති තීරණ අංක 1097 දරන තීරණය යටතේ මවිසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

වයි. එම්. සේනානායක,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
වාරියපොල ප්‍රාදේශීය සභාව.

**තීරණය**

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වැනි අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාතේ, පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබූ 2015.09.25 වැනි දින අංක 1933/40 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී *ජනරජයේ ගැසට් පත්‍රයේ* iv(අ) වැනි කොටසේ පළ කරනු ලැබුවා වූ,

ප්‍රාදේශීය ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන අතුරු ව්‍යවස්ථාවේ 3 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුව වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ක්‍රියාත්මක විය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මා තීරණය කරමි.

02-447

---

### මොරටුව මහ නගර සභාව

1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ පණත

මෙහි පහත උපලේඛනයේ දැක්වෙන තැනැත්තා විසින් ඔහුගේ නම ඉදිරියෙන් දැක්වෙන සමාජ ශාලාව එකී ස්ථානයේ පැවැත්වීම සඳහා 2016 වර්ෂයට බලපත්‍රයක් ලබා ගැනීමට මා වෙත අයදුම්පත්‍රයක් ඉදිරිපත් කොට ඇති බව 1975 අංක 17 දරන සමාජශාලාවලට බලපත්‍ර දීමේ පනතේ 6 වන වගන්තිය යටතේ දැනුම් දෙනු ලැබේ.

එකී සමාජ ශාලාව අසළ හෝ සමාජශාලාව සඳහා අපේක්ෂිත ස්ථානය අසළ හෝ යම් පදිංචි තැනැත්තෙකු එම සමාජශාලාව සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවූ දින සිට සති 4ක් ඇතුළත තම විරෝධතාවයට හේතු ලියවිල්ලකින් දක්වමින් පිටපත් දෙකකින් යුක්තව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

උපලේඛනය

| *ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය* | *සමාජශාලාවේ සභාපතිද, ලේකම් ද, කළමනාකරුද යන වග* | *සමාජශාලාවේ නම* | *සමාජශාලාවේ කටයුතු කරගෙන යාමට බලාපොරොත්තු වෙන ස්ථානය* |
|---|---|---|---|
| ඩී. බ්‍රයන් කුරේ, 11, වොට්සන් පීරිස් මාවත, මොරටුව. | සභාපති | කැටමරන්ස් ක්‍රීඩා සමාජය | 186/6, නව ගාළු පාර, මොරටුව. |
| ආර්. එස්. ප්‍රනාන්දු 1/10, 47 වන පටුමග, කොළඹ 06. | කළමනාකරු | සිලෝන් මෝටර් යොච් ක්ලබ් | අංක 31, ඉදිබැද්ද, මොරටුව |

නාගරික කොමසාරිස්,
මොරටුව මහ නගර සභාව.

02-556

---

**අරණායක ප්‍රාදේශීය සභාව**

විනෝද බදු පැනවීම

අරණායක ප්‍රාදේශීය සභාවේ ටී. එම්. චන්ද්‍රාවතී වන මා හට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව අරණායක ප්‍රාදේශීය සභාවේ කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කරන නිලධාරියා වශයෙන් 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනත අනුව අරණායක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවත්වනු ලබන විනෝද ප්‍රසංගයකට ඇතුළත්වීමේ ගාස්තුවෙන් 25% (සියයට විසිපහක) විනෝද බද්දක් අරණායක ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව මෙයින් නිවේදනය කරමි.

පී. එම්. චන්ද්‍රාවතී,
ලේකම්,
අරණායක ප්‍රාදේශීය සභාව.

2016 ජනවාරි මස 27 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

02-629

---

# විවිධ දැන්වීම්

**ඌව පරණගම ප්‍රාදේශීය සභාව**

අක්කර බද්ද පැනවීම - 2016 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(3) වගන්තිය ප්‍රකාරව, ඌවපරණගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියාවූ, ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් කරන්නාවූ ඉඩම් වලින් පහත උපලේඛනයේ සඳහන් ප්‍රමාණයන්ගෙන් යුත් අක්කර බද්දක් 2016 වර්ෂයට අය කිරීමට තීරණය කර ඇති බැව් මෙයින් නිවේදනය කරමි.

ජේ. කුමාරසිංහ,
ලේකම්,
ඌවපරණගම ප්‍රාදේශීය සභාව.

2016 ජනවාරි මස 20 වැනි දින,

**උපලේඛනය**

ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් එකට වැඩිමුත්,

| | | |
|---|---|---|
| 01. | හෙක්ටයාර් 05 ට අඩු වන අස්ථාවක | රු. 50. 0 බැගින් |
| 02. | හෙක්ටයාර් 05 ක් හෝ ඊට වැඩි වන අවස්ථාවක එක් හෙක්ටයාරයකට | රු. 10. 0 බැගින් |

02-457

**අක්මීමන ප්‍රාදේශීය සභාව**

2016 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09.3 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2016 වර්ෂය සඳහා අක්මීමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන පහත උපලේඛනයේ සඳහන් ව්‍යාපාර මත බලපත්‍ර ගාස්තු පනවා අයකරන බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(අ) වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනත යටතේ අමාත්‍යවරයා විසින් සාද අංක 520/7 හා 1988.08.23 වැනි දින පළ කර ඇති එකී පනතේ 02 වැනි වගන්තියේ 03 වැනි උපවගන්තියේ විධිවිධානවලට යටත්ව අක්මීමන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වගෙන යාම සඳහා 1990 වර්ෂයේ දී අක්මීමන ප්‍රාදේශීය සභාව විසින් වැළඳගෙන 1991.03.22 දිනැති අංක 655 දරන ගැසට් පත්‍රයේ පළකර ඇති නිවේදනය පරිදි නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම මත ගාස්තුවක් අයකරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ටී. ජී. ඊසවතී,
ලේකම්,
අක්මීමන ප්‍රාදේශීය සභාව.

2015 නොවැම්බර් මස 20 වැනි දින,
පින්නදූව, වලහන්දූව,
අක්මීමන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| අනු. අංකය | කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය | *I වැනි තීරුව* වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට රු. ශත | *II වැනි තීරුව* වාර්ෂික වටිනාකම රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත | වාර්ෂික වටිනාකම රු. 1,500ට ඉක්මවන විට රු. ශත |
|---|---|---|---|---|
| 01 | බත් කඩයක් හෝ ආපන ශාලාවක් හෝ භෝජනාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02 | තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 03 | කිරි පට්ටියක් හෝ කිරි වෙළෙඳාමක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 04 | මාළු හෝ කුකුල්මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 05 | ඌරු මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06 | එළහරක් මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 07 | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 08 | කොණ්ඩා සැකසීමේ සැළුන් හලක් හෝ බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 09 | හෝටලයක් පවත්වගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10 | රසකැවිලි, ටින් හෝ ඇසුරුම්ව ඇති නිෂ්පාදිත ද්‍රව්‍ය, අයිස්වල දමා ඇති මස්, කිරිපිටි වර්ග හෝ බීම වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11 | අවමංගල්‍ය මල් ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12 | සිසිල් බීම නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13 | ශීත කරන ලද ආහාර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14 | ටයර් හා ටියුබ් වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15 | ගිණිකෙළි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16 | කලුගල් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17 | ගෝඝාතකාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18 | බේකරි හෝ බේකරි කෑම වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19 | ලැගුම් නිවාසයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20 | අයිස්ක්‍රීම් නිෂ්පාදනය (යෝගට්/අයිස් පැකට්) | 500 0 | 750 0 | 1,000 0 |
| 21 | සංචාරක මාළු වෙළෙඳාම සඳහා දිනකට | 500 0 | 750 0 | 1,000 0 |
| 22 | සංචාරක වෙනත් වෙළෙඳාම් කටයුතු වෙනුවෙන් (දිනකට) | 250 0 | | |
| 23 | සංදර්ශන/ඉඩම් වෙන්දේසි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම වෙනුවෙන් (දිනකට) | 1,000 0 | | |

02-446

**පන්නල ප්‍රාදේශීය සභාව**

(176 වැනි අධිකාරය) ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥපනත යටතේ ගාස්තු පැනවීම සංශෝධනය කිරීම

පන්නල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍ය ඉටුකරන පන්නල ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්. පී. සී. රේණුකා වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු 176 වැනි අධිකාරිය වන ප්‍රසිද්ධ රඟ දක්වීම් ආඥපනතේ 3 වැනි වගන්තිය ප්‍රකාර පන්නල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2016 වර්ෂයට අදළව සංදර්ශන බලපත්‍ර ගාස්තු නියම කිරීම සඳහා වූ 2015.11.20 දිනැති iv (ආ) කොටස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* සිංහල භාෂාවෙන් පළකරන ලද නිවේදනය පහත පරිදි සංශෝධනය විය යුතු බවට තීරණය කර මෙයින් නිවේදනය කරමි.

එම්. පී. සී. රේණුකා,
ලේකම්,
පන්නල ප්‍රාදේශීය සභාව.

2016 ජනවාරි මස 01 වැනි දින,
පන්නල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

මුදල් අයකර පෙන්වනු ලබන සියලුම සංදර්ශන සඳහා රු. 1,000 0

02-582

---

සංශෝධනයයි

**රත්නපුර ප්‍රාදේශීය සභාව**

2015.12.23 දින අංක 1,947 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* iv (ආ) කොටස - විවිධ දැන්වීම් යටතේ 12-741/6 නිවේදනයේ

(01) විවිධ අයදුම්පත්‍ර ගාස්තු යටතේ ඃ

(i) අනතුරුදයක ගස් කැපීමේ අයදුම්පත්‍ර ගාස්තුව රු. 230 ලෙස සඳහන් වී ඇත.

එම ගාස්තුව රු. 250ක් ලෙස සංශෝධනය කරනු ලැබේ.

ලේකම්,
රත්නපුර ප්‍රාදේශීය සභාව,
ගිලීමලේ.

2016 පෙබරවාරි මස 02 වැනි දින,
රත්නපුර ප්‍රාදේශීය සභාව,
ගිලීමලේ.

02-581

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.